# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2239/44 - 2021 අගෝස්තු මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2021.08.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 5/83(II)

**1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනත**

1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පළිබෝධනාශක තාක්ෂණික හා උපදේශක කමිටුව විසින් සාදනු ලැබ, කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද රීති.

පළිබෝධනාශක තාක්ෂණික හා උපදේශක කමිටුවේ නියමය පරිදි,

ආචාර්ය ජේ. ඒ. සුමිත්,
ලේකම්,
පළිබෝධනාශක තාක්ෂණික හා උපදේශක කමිටුව.

2021 ජූනි මස 21 වැනි දින,
පේරාදෙණියේ දී ය.

රීති

1. මෙම රීති 2021 අංක 1 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ (පළිබෝධනාශක තාක්ෂණික හා උපදේශක කමිටු) රීති ලෙස හඳුන්වනු ලැබේ.

2. පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් (මෙහි මින් මතු ''කමිටුව'' යනුවෙන් සඳහන් කරනු ලබන) පළිබෝධනාශක තාක්ෂණික හා උපදේශක කමිටුවේ සභාපතිවරයාගේ විධානය යටතේ කමිටුවේ රැස්වීම් කැඳවනු ලැබිය යුතු ය.

3. අවම වශයෙන් සෑම මාස දෙකකට වරක් කමිටු රැස්වීම් පැවැත්විය යුතු අතර, කමිටුවේ රැස්වීමක් සඳහා වූ ගණපූරණය සාමාජිකයන් අටදෙනෙකු විය යුතු ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

4. කමිටුවේ සභාපතිවරයා විසින් අවශ්‍ය යැයි සලකන අවස්ථාවන් හි දී, සිය කමිටු සාමාජිකයින්ට, නිවේදනය ලැබුණු දිනය හැර, නමුත් නිවේදනය නිකුත් කරනු ලබන දිනය ඇතුළත්ව අවම වශයෙන් දින දහයක දැනුම් දීමකින් පසු කමිටුව රැස් කිරීමට ඉල්ලීමක් සිදු කළ හැකිය. එම කමිටු රැස්වීම පැවැත්වෙන වේලාව, දිනය හා ස්ථානය සහ කමිටු රැස්වීම පැවැත්වෙන්නේ යම් විශේෂිත කාරණාවක් සම්බන්ධයෙන් නම් එම කාරණාවේ ස්වභාවය එම නිවේදනයේ සඳහන් කළ යුතු ය.

5. කමිටුවේ රැස්වීම් තුනකට අඛණ්ඩව නොපැමිණෙන කමිටුවේ යම් සාමාජිකයකු කමිටුවේ සාමාජිකයකු වීම නතර කරනු ලැබිය යුතු ය.

6. කමිටුව විසින් තීරණය කළ යුතු යම් යොමු කිරීමක් පිළිබඳ වූ සෑම තීරණයක් ම එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයින්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු අතර, යම් අවස්ථාවක දී සමාන ඡන්ද සංඛ්‍යාවක් ලැබුණහොත් අවස්ථාවෝචිත පරිදි, කමිටු සභාපතිවරයා හෝ කමිටු රැස්වීමේ මුලසුන දරන සාමාජිකයාට ස්වකීය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් ප්‍රකාශ කළ හැකිය.

7. සභාපතිවරයා විසින් කමිටුවේ සෑම රැස්වීමක ම මුලසුන දැරිය යුතු අතර යම් කමිටු රැස්වීමකට සභාපතිවරයා නොපැමිණියහොත් එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයින් විසින් පත් කර ගනු ලැබූ සාමාජිකයකු විසින් එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

8. කමිටුව විසින් තීරණය කළ යුතු යම් යොමු කිරීමක් පිළිබඳ වූ කිසිවක් හෝ සාකච්ඡා කරන ලද කිසිවක් හෝ කිසිදු සාමාජිකයකු විසින් අනාවරණය කිරීම සිදු නොකළ යුතු ය.

9. යම් කමිටු සාමාජිකයකුගේ පත්වීම පිළිබඳ දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් කමිටුවේ යම් ක්‍රියාවක්, තීරණයක් හෝ ක්‍රමවේදයක් අවලංගු ලෙස සලකනු නොලැබිය යුතු ය.

10. කමිටුව විසින් තීරණය කළ යුතු එක් එක් යොමු කිරීමක් සම්බන්ධයෙන් වූ වාර්තා, කමිටු රැස්වීමේ තීරණ, වාර්තා තබාගැනීම හා පවත්වා ගැනීම කමිටු ලේකම් විසින් සිදු කළ යුතු ය.

11. කමිටුවේ සෑම සාමාජිකයකු විසින් ම තමාට කමිටුවේ සාමාජිකයකු ලෙස තම කර්තව්‍යයන් ඉටු කිරීමට අගතිගාමී ලෙස බලපැවැත්විය හැකි කිසිදු මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතා නොමැති බවට ප්‍රකාශයක් සිදු කළ යුතු ය.

12. කමිටුව විසින් තීරණය කළ යුතු සෑම කාරණාවක් පිළිබඳ යොමු කිරීමක් ම එම කාරණාව පිළිබඳව සම්පූර්ණ සහ සංක්ෂිප්ත ප්‍රකාශයක් ද සහිතව ලිඛිතව කමිටුවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර එම සෑම යොමු කිරීමක් ම ලේකම්වරයා විසින් කමිටු සභාපතිවරයා වෙත යවනු ලැබිය යුතු ය.

13. පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්වරයා විසින් කමිටුව විසින් ගනු ලබන තීරණ කමිටුවේ අනුමතය සහිතව අදාළ පාර්ශවයන් වෙත ලිඛිතව දැනුම් දීම සිදු කළ යුතු ය.

08 - 252

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.